බොරලැස්ගමුව නගර සභාව
කොළඹ දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 03 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 23 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 21 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට බොරලැස්ගමුව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) **ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට උපලේඛන අනුව කර්මාන්ත ණයහිමි ශේෂය රු.21,812,725 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල රු.21,709,752 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | 2017 වර්ෂයේ මිලදී ගත් රු.325,000 ක් වටිනා මහන මැෂින් 10 ක් ප්‍රතිලාභීන්ට බෙදා හැර තිබුණද යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් වලින් ඉවත් කළ යුතු වේ. | පිළිගනිමි. 2020 වර්ෂයේ අවසාන ගිණුමෙන් සකස් කරමි. |
| (iii) | 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපූර්ණය නොවූ හිඟ වැටුප් රු.928,706 ක් කපා හැරීමට පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.) විසින් ලබාදුන් අනුමැතියට පටහැනි ලෙස රු.1,283,380 ක් කපා හැරීම නිසා හිඟ හිටි ශේෂය රු.354,674 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. 2020 වර්ෂයේ අවසාන ගිණුමෙන් සකස් කරමි. |
| (iv) | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් මිලදී ගෙන සභාවට ලබා දුන් කම්පැක්ටර් රථය සඳහා වාරික 03 ක මුදල් රු.1,142,000 ක් අයකිරීමෙන් පසුව මුද්දර ආදායම් රු.9,503,765 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් මුද්දර | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

ආදායම රු.1,142,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) **නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂයන් ඒවාට අදාළ උපයෝගී ලේඛන/වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රකාශනවල රු.264,026 ක් වැඩියෙන් හා රු.1,807,367 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. 2020 වර්ෂයේ අවසාන ගිණුමෙන් නිවැරදි කරමි. |

(ඇ) **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| රු.8,519,509 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් එනම් අසම්භාව්‍ය බැරකම් රු.76,850 ක් හා විවිධ තැන්පත් රු.8,432,659 ක් සඳහා උපලේඛනද පෙර ගෙවුම් අත්තිකාරම් රු.10,000 ක් සඳහා රිසිට්පත ද විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | අසම්භාව්‍ය වත්කම් හා විවිධ තැන්පත් සඳහා උපලේඛන ඉදිරියේදී විගණනය වෙත ඉදිරිපත් කරමි.<br>පෙර ගෙවුම් අත්තිකාරම් සඳහා උපලේඛන නොමැති බවත් දන්වමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| XLVII වන පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්තිය | රු.42655 ක ණය ශේෂ නිරවුල් නොකළ නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වර්ෂ ගණනාවක සිට පවතින ණය ශේෂ ණය කරුවන්ගෙන් අය කර ගැනීමට නොහැකි බැවින් කපා හැරීමට 2020.02.07 දිනැති ලිපිය මඟින් සහකාර පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇත. ණය ශේෂ වංචා කිරිමට අදාළව නඩුවක් ගොනු කර ඇත. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

| | | | |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ක් ඉක්ම වූ රු.333,024 ක ආපසු ගෙවිය යුතු තැන්පතු සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. 2020 වර්ෂයේදී ආදායමට ගැනීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.76,870,331 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.39,245,030 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 |
| වරිපනම් හා බදු | 27,510 | 26,919 | 26,150 | 17,036 | 26,525 | 25,772 | 22,760 | 16,872 |
| කුලී | 1,961 | 2,162 | 2,237 | 431 | 1,961 | 990 | 1,042 | 178 |
| බලපත්‍ර ගාස්තු | 652 | 378 | 378 | - | 702 | 2,041 | 2,118 | 202 |
| වෙනත් ආදායම් | 59,618 | - | 44,488 | 51,749 | 48,431 | - | 51,962 | 2,026 |

2.2.2 **වරිපනම් හා බදු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | බිල්කළ වරිපනම් බදු ආදායමෙන් රු.18,331,392 ක් වර්ෂය තුළ අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | බිල් කරන ලද වරිපනම් බදු ආදායම අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | බිල්කළ වරිපනම් ආදායම ප්‍රවර්ථන වර්ෂය තුළ සියයට 70 ක ප්‍රමාණයක් අයකර ගෙන ඇත. අවසාන කාර්තුවට අදාළ (ප්‍රවර්ථන) වරිපනම් අයකර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ගයක් මඟින් එළඹෙන වර්ෂයේ පළමු මාසයේ පළවන කාර්තුව තුළ අයකර ගැනීමට සිදුවන බැවින් බොහෝ විට අවසාන කාර්තුවේ කොටසක් හිඟයක් ලෙස පවතී. |
| (ආ) | ඉකුත් වර්ෂය අවසානයට වරිපනම් ණයගැති ශේෂය රු.16,871,802 ක් වුවද ඉන් රු.9,342,704 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | හිඟ වරිපනම් බදු ආදායම අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | හදිසි ආපදා තත්වයෙන් පසු හිඟ අය කිරීමේ කටයුතු දැනට ආරම්භ කර ඇති බව දන්වමි. |
| (ඇ) | රු.50,000 ක් ඉක්මවූ හිඟ වරිපනම් ඒකක 8 කින් රු.535,089 ක හිඟ වරිපනම් බදු අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු ආදායම අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | රු.50,000 ට වැඩි හිඟ ඇති ලේඛනය අනුව පවත්නා දේපල වලින් වරිපනම් අයකර ගත් අතර ස්ථාන දෙකකින් පවතින හිඟය කොටස් වශයෙන් ගෙවීමට එකඟතාවය පල කර ඇති බැවින්, ඒ අනුව හිඟ එකතු කිරීමට කටයුතු කරන අතර නෛතිකව අයකර ගැනීමට නොහැකි දේපල කපා හැරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඈ) | 1980 දෙසැම්බර් 31 දිනැති අංක සීඩී.2/3/101 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව දේපල වර්ෂ 5 කට වරක් තක්සේරු කර වරිපනම් බදු අයකළ යුතු වුවද සභාව විසින් 2009 වර්ෂයෙන් පසු දේපල තක්සේරු කර නොතිබුණි. | දේපල වර්ෂ 5 කට වරක් තක්සේරු කළ යුතුවේ. | 2020 වර්ෂය තුළ නව තක්සේරුව සිදු කිරීම ආරම්භ කර ඇත. මේ වන විට කල්පිත කුලිය ද ගණනය කර ඇත. කොවිඩ් -19 හේතුවෙන් මාර්තු මස සිට ක්ෂේත්‍ර මැනුම් කටයුතු අඩාල වී ඇත. |

2.2.3 **කුලී**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | කඩකුලි ගිවිසුමෙහි කොන්දේසි අංක 02 අනුව කුලිය ගෙවීම මසකට අධික කාලයක් ප්‍රමාද වුවහොත් කඩකාමරයේ අයිතිය අහිමිවන බව සඳහන් නමුත් | ගිවිසුම් කොන්දේසි අනුව කටයුතු කළ යුතුවේ. | මාස 03 කට වැඩි හිඟ අයකර ගැනීම සඳහා අවසාන නිවේදන නිකුත් කර ඇති අතර ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| | කඩකාමර 10 කින් මාස 03 සිට 15 දක්වා කාලයක් රු.116,214 ක කඩකුලී අය වී නොතිබුණද ගිවිසුමෙහි කොන්දේසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | කඩකුලී ගිවිසුමෙහි කොන්දේසි අංක 12 සහ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛය අනුව වසර 05 කට වරක් කඩ කුලිය සංශෝධනය කළ යුතු වුවද 2009 වර්ෂයෙන් පසු ගාස්තු ප්‍රතිශෝධනය කිරීමක් හෝ ගිවිසුම් අලුත් කිරීමක් සිදු කර නොතිබුණි. | ගිවිසුම් කොන්දේසි හා චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුවේ. | ගිවිසුම් යාවත්කාලීන කිරීම හා කුලී සංශෝධනය සඳහා වෙළෙඳ ස්ථාන හිමියන් විරෝධතාවය එල කර ගිවිසුම් යාවත්කාලීන කිරීම ප්‍රතික්ෂේප කරන ලදී. මේ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්තුමිය දැනුවත් කර ඇත. සාකච්ඡාවක් කැඳවා ගිවිසුම යාවත්කාලීන කරන බව දන්වමි. |
| (ඇ) | කඩකුලී ගිවිසුම් වර්ෂ 03 කට වරක් අලුත් කළ යුතු වුවද වර්ෂ 04 සිට 10 දක්වා කාලයක් කඩ 38 ක ගිවිසුම් අලුත් කර නොතිබුණි. | ගිවිසුම් වර්ෂ 03 කට වරක් අලුත් කළ යුතුවේ. | අතුරු බඳුදීම්වලට අදාළ පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛනයට අනුව කටයුතු කිරීමට හා ගිවිසුම් අලුත් කිරීමට එකඟතාවය ලබා නොදුන් අතර මේ සම්බන්ධව ද අදාළ දැනුවත් කිරීම් සිදුකරන ලදී. |

2.2.4 බලපත්‍ර ගාස්තු
--------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | -------------------------- | --------------- | ------------------------- |
| (අ) | 2012 සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළ රු.189,200 ක හිඟ ව්‍යාපාර බදු අයකරගැනීමට අපොහොසත් වී තිබුණි. | හිඟ ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | දැනට පවත්නා ස්ථාන වලින් බදු අයකර ගැනීමට කටයුතු කළ අතර, වසා ඇති ස්ථානවල හිඟ ශේෂ නෛතික අය කර ගත නොහැකි හිඟ ආදායමක් සේ කටයුතු කරමින් පවතී. |
| (ආ) | රු.36,000 ක හිඟ බදු අයකර ගැනීම සඳහා ව්‍යාපාර 39 කට නඩු පවරා තිබුණද ප්‍රවර්තන වර්ෂය තෙක් හිඟ බදු අයකර ගෙන නොතිබුණි. | හිඟ ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ව්‍යාපාර බදු අයකර ගැනීම සඳහා සමථ මණ්ඩලය වෙත යොමු කර ඇත. |

2.2.5 මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| නුගේගොඩ දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2018 ජුනි දක්වා ලැබිය යුතු මුද්දර ආදායම් රු.30,851,525 ක් ලෙස හඳුනා ගෙන තිබුණද 2018 ජුලි සිට 2019 දෙසැම්බර් දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන නොතිබුණි. | 2018 ජුලි සිට 2019 දෙසැම්බර් දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු හඳුනාගත යුතුවේ. | 2018 වසර සඳහා සකස් කරන ලද මුද්දර ආදායම වන රු.41,416,273 කට අදාළ උපලේඛන පළාත් දේශිය ආදායම් කොමසාරිස් වෙත යොමු කර ඇත. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1. **කාර්ය සාධනය**

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තෘවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- | --- |
| (i) | 2019 වර්ෂය තුලදී සභා බල ප්‍රදේශයේ වෙන් නොකරන ලද කසළ ටොන් 6938.28 ක් වූ අතර කසල එකතු කිරීම නිසි පරිදි කළමනාකරණය නොකිරීම නිසා මිශ්‍ර අපද්‍රව්‍ය වෙනුවෙන් රු.4,162,968 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි. | කසළ එකතු කිරීම නිසි පරිදි කළමනාකරණය කළ යුතුවේ. | බල ප්‍රදේශය තුල කසළ වෙන් කිරීම පිළිබඳව විශේෂ දැනුවත් වීමේ වැඩසටහන්ද, කසළ පොළ වැඩසටහන්ද නිරතුරුව පවත්වමින් මහජනතාව දැනුවත් වීම් කළද කසළ වෙන් කිරීම පිළිබඳව ජනතාව තුළ ඇත්තේ ඉතා මන්දගාමී ස්වභාවයකි. |
| (ii) | 2019 ජනවාරි සිට පෞද්ගලික ආයතනවල ටොන් 40.67 ක කසළ ඉවත් කිරීමෙන් රු.379,500 ක ආදායමක් ලබා ගැනීමට හැකිවී තිබුණද අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාවක් සම්මත කරගත යුතුවේ. | කසළ එකතු කිරීමට අතුරු ව්‍යවස්ථාවක් අදාළ කර ගැනීමට කටයුතු කරමි. |

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නව පුස්තකාල ගොඩනැගිල්ලක් කුලියට ගැනීම සඳහා 2018 පෙබරවාරි 01 දින ගිවිසුම්ගත වී අත්තිකාරම් වශයෙන් රු. ලක්ෂ 12 ක් සහ මාසිකව රු.100,000 බැගින් ගෙවීම් කර තිබුණි. පුස්තකාලයකට සුදුසු පරිසරයක් හා ආරක්ෂාව පිළිබඳ සැලකිළිමත් නොවී කටයුතු කිරිම නිසා පාඨකයන් සංඛ්‍යාව අඩු වී මෙන් ඵලදායිතාවයක් ලබා ගැනිමට නොහැකි වී තිබුණි. | පුස්තකාල ස්ථාපිත කිරිමේදි සුදුසු පරිසරයක් හා පාඨකයන්ගේ ආරක්ෂාව පිළිබඳ සැලකිළිමත් විය යුතුවේ. | තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිරීක්ෂණ හා නිර්දේශ අනුව එම ගොඩනැගිල්ල ප්‍රසම්පාදන කමිටුව විසින් කරන ලද ස්ථාන පරීක්ෂාවෙන් අනතුරුව තෝරාගෙන ඇත. |

3.3 **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත තනතුරු වල පුරප්පාඩු 8 ක් පැවතුණි. | අත්‍යවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. පුරප්පාඩු පිරවීමට ඉදිරියේදී කටයුතු කරමි. දැනටමත් ඒ සඳහා ගැසට් කර ඇත. |
| (ආ) | සේවය හැර ගිය නිලධාරීන් 07 දෙනෙකුගේ අයවිය යුතු උත්සව සහ විශේෂ ණය ශේෂය රු.39,950 ක් විය. | ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වර්ෂ ගණනාවක සිට පවතින අය කර ගත නොහැකි ණය ශේෂ කපා හැරිමට 2020 පෙබරවාරි 07 දිනැති ලිපිය මඟින් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇත. |
| (ඇ) | විශ්‍රාම ගිය සහ ස්ථාන මාරු වී ගිය නිලධාරීන් තිදෙනෙකුට ලබාදුන් රු.13,896 ක් වූ ණය ශේෂයෙන් රු.11,191 ක් වාරික වශයෙන් අයකරගෙන ඇතත් අයවිය යුතු ශේෂයක් වශයෙන් පැවතුණි. | ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | මූල්‍ය වංචාව සම්බන්ධව නුගේගොඩ මහේත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනුකර ඇතත් නඩු කටයුතු අවසන් වී නැත. |
| (ඈ) | වැඩ තහනමකට ලක් වූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.79,868 ක ශේෂය අය කර ගැනීමට නොහැකී වී තිබුණි . | ණයකරුවන් ණය පැහැර හරින අවස්ථාවන්හි ඇපකරුවන්ගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | නිලධාරීන්ගේ ණය ශේෂ ඇප කරුවන්ගෙන් අය වෙමින් පවතී. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2018 සහ 2019 වර්ෂ තුළ වගකීම් කාලය ඉකුත්වීමට පෙර දැවුණු විදුලි බුබුළු 289 න් විදුලි බුබුළු 189 ක් මාරුකර ගැනීමට නොහැකි වී තිබුණි. | වගකීම් කාලය ඉකුත්වීමට පෙර සේවාව ලබා ගැනිමට කටයුතු කළ යුතුවේ. | විදුලි බුබුළු ලබාදෙන ලෙස ඉල්ලීම් කළ අතර මේ වන විට බුබුළු 100 ක් පමණ ඔටෙක් ආයතනයෙන් ලබා දී ඇත. ඉදිරියේදි ඉතිරි විදුලි බුබුළු ලබා ගැනීමට කටයුතු කරමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2019 වර්ෂයේ මිලදීගත් රු.373,637 ක් වටිනා ලී බඩු හා කාර්යාල උපකරණ අයිතම 15 ක් සහ රු.5,204,020 ක් වටිනා විදුලි ජනක යන්ත්‍ර 2 ක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කළ යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරමි. |

### 3.5.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| මිනි කම්පැක්ටර් රථයට අළුතින් ටැංකියක් සහ නව වැසියක් සවිකර පින්තාරු කිරීම සඳහා රු.1,210,000 ක් වැය කර තිබුණද සවිකර ඇති ටැංකිය පැස්සුම් කර සකස් කරන ලද පැරණි ටැංකියක් වූ අතර ගලවා ඉවත් කරන ලද ටැංකිය 2020 මැයි 18 දින වන විටත් ගරාජයෙන් නැවත ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | වැඩ හා සේවා කඩිනමින් හා කාර්යක්ෂමව නිසි ප්‍රමිතියෙන් යුක්තව අපරික්ෂාවෙන් තොරව ඉටු කළ යුතුවේ. | පිළිගනිමි. රු.1,210,000 ක් වැයකර එම අළුත්වැඩියාව සිදු කර ඇත. පැරණි ටැංකිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. |